# කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය
## Smallholder Agribusiness and Resilience Project

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD), ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය ණය ආධාර සපයන ප්‍රධාන ආයතනය වන අතර ශ්‍රී ලංකා රජයද (GOSL) මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය දායකත්වය සපයයි. ව්‍යාපෘතියේ ප්‍රධාන අභිප්‍රාය වන්නේ වියළි කලාපීය කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන්ගේ දරිද්‍රතාවය අවම කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමයි.

| | |
|---|---|
| **ක්‍රියාත්මක කිරීම** | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| **මූල්‍ය අනුග්‍රහය** | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල |

### ව්‍යාපෘතියේ ඉලක්කය

කුරුණෑගල, පුත්තලම, මාතලේ, අනුරාධපුර, මන්නාරම හා වව්නියාව දිස්ත්‍රික්ක වල තෝරාගත් ග්‍රාම නිලධාරී වසම්වල කුඩා පරිමාණ කෘෂි ව්‍යවසායකයන්ගේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම හා දිළිඳුකම පිටුදැකීම.

### ව්‍යාපෘතියේ අරමුණ

ව්‍යාපෘති ප්‍රදේශවල 40,000ක් වන කෘෂි ව්‍යවසායකයන්ගේ වෙළඳපල සහභාගිත්වය වැඩිකිරීම සහ දේශගුණ විපර්යාස සඳහා ඔරොත්තුදීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම.

### ව්‍යාපෘතියේ ප්‍රතිලාභින්

කුරුණෑගල, පුත්තලම, මාතලේ අනුරාධපුර, මන්නාරම හා වව්නියාව යන දිස්ත්‍රික්ක වල සිටින කුඩා පරිමාණ ගොවින්/ගොවි පවුල් 40,000 ක් හෝ පුද්ගලයන් 180,000 ක් ව්‍යාපෘතියේ ප්‍රතිලාභින් වේ. ඉන් පහත සදහන් ප්‍රතිලාභින් කාණ්ඩ තුන කෙරෙහි වැඩි අවධානයක් යොමුකරනු ලබයි.

1.ග්‍රාමීය අන්ත දිළිඳු ගොවීන්/ගොවි පවුල්.

2.දේශිය වෙළඳපොල වෙත කෘෂි නිෂ්පාදන සැපයීමට හැකියාව ඇති දිළිඳු ගොවීන්/ගොවි පවුල්.

3.ප්‍රධාන වශයෙන් වෙළඳපල ඉලක්ක කරගනිමින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්/ගොවි පවුල්.

### ව්‍යාපෘතියේ අවධානය යොමු කරන ප්‍රධාන ක්ෂේත්‍ර

- කෘෂි ව්‍යාපාර සංවර්ධනය අගය දාම සංවර්ධනය හා තාරුණ්‍ය සවිබලගැන්විම
- වැව් ප්‍රතිසංස්කරණය
- කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධනය
- ස්වභාවික සම්පත් කළමනාකරණය
- සමාජ අන්තර්කරණය හා ආයතනික සංවර්ධනය
- පෝෂණය
- පසු අස්වනු කළමනාකරණය

#### ව්‍යාපෘතියේ ප්‍රතිලාභ

1.කුඩා පරිමාණ කෘෂි ව්‍යාවසායකයන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා අඛණ්ඩ ජල සැපයුම සහ ඉඩම් සදහා ප්‍රවේශ වීමේ හැකියාව වර්ධනය වීම.

2.කෘෂි නිෂ්පාදනවල ඵලදායිතාව වැඩිවීම.

3.දේශගුණ විපර්යාස වලට ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය වීම.

4. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල දිළිඳුකම අවමවීම හා ආහාර සුරක්ෂිතතාවය ඇතිවීම.

5.ග්‍රාමීය රැකියා උත්පාදනය වීම.

06. කාන්තාවන් හා තරුණ ප්‍රජාවගේ ධාරිතා සංවර්ධනය වීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ඔවුන්ගේ සහභාගිත්වය ඉහළයාම.

### ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන දිස්ත්‍රික්ක




| HUB 1 | HUB 2 |
|---|---|
| කුරුණෑගල | අනුරාධපුර |
| පුත්තලම | මන්නාරම |
| මාතලේ | වව්නියාව |

ඉහත දිස්ත්‍රික්ක අයත්වන මල්වතු ඔය, දැදුරු ඔය සහ මී ඔය යන ගංගා ද්‍රෝණිවල පිහිටි එල්ලංගා පද්ධති පදනම් කර ගනිමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

### සම්බන්ධීකරණ තොරතුරු

#### ව්‍යාපෘති කාර්යාලය

අංක 2/2/1, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල

+9411-2770986

info@sarp.lk

www.sarp.lk

| නිකවැරටිය උප කාර්යාලය | මැදවච්චිය උප කාර්යාලය |
|---|---|
| ගොවිජන පුහුණු ආයතනය, නිකවැරටිය | අංක 554, කටුවෙල පාර, මැදවච්චිය |
| +9477-3994789 | +94252228700 |
| sarp.hub1@gmail.com | sarp.hub2@gmail.com |

### අපගේ සමාජ මාධ්‍ය හා එක්වන්න

SARP Sri Lanka